# ජ්‍යෙෂ්ඨ පුරවැසි කිරීමේ ගිණුම් - නියමයන් හා කොන්දේසි

පහත සඳහන් නියමයන් හා කොන්දේසි (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හැඳින්වෙන) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. - පී.ක්‍යූ.118 තුළ ආරම්භ කොට පවත්වා ගෙන යනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම් සම්බන්ධයෙන් බලපැවැත්වෙනු ඇත.

"ජ්‍යෙෂ්ඨ පුරවැසියා" යන්නෙන් වයස අවුරුදු 60 ට වඩා වැඩි කෙනකු අදහස් කෙරේ.

1. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හට පාස්පොත් ඉතිරි කිරීමේ ගිණුම් හෝ ප්‍රකාශ ඉතිරි කිරීමේ ගිණුම් වශයෙන් 'ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම්' විවෘත කළ හැකි ය.

2. බැංකුවට පිළිගත හැකි අනන්‍යතාව සනාථ කරන ලියැවිල්ලක් (උදා:- ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය, රියදුරු බලපත්‍රය) සහ ලිපි ලැබෙන ලිපිනය සනාථ කර ලියැවිල්ලක් (උදා:- මෑතකාලීන උපයෝගිතා බිල්පතක්, බැංකු ප්‍රකාශයක්)මගින්නිසැක ලෙස හඳුනා ගැනීමෙන් අනතුරුව අනුමත කරනු ලබන තැනැත්තකු/ තැනැත්තන් හට මෙම ගිණුම විවෘත කළ හැකි ය.

3. ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම

   (අ) යම් තැනැත්තකුට තමාගේම නමින් ආරම්භ කළ හැකි ය.
   (ආ) ජ්‍යෙෂ්ඨ පුරවැසියා මූලික ගිණුම් දරන්නා වශයෙන් සිටිමින් මුදල් ආපසු ගැනීමට බලය ඇත්තේ කවර අයටද යන්න පිළිබඳව නිරවුල් උපදෙස් මැන්ඩේට් පෝර්මයේ සඳහන් කරමින්ඒකාබද්ධව පුද්ගලයින් දෙදෙනකුගේ හෝ ඊට වැඩි ගණනකගේ නමින්ආරම්භ කළ හැකි ය.

4. සෑම ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමක් සඳහාම අංකයක් ලබා දෙනු ලබන අතර, එය බැංකුව සමග කෙරෙන සෑම ලිපි හුවමාරුවකදීම සහ මුදල් තැන්පත් කිරීමේ හා ආපසු ගැනීමේ ලුහුපත්වලද සඳහන් කරනු ලැබිය යුතු ය.එසේ දෙනු ලබන අංකය ගිණුම් දරන්නා වෙත දන්වා වෙනස් කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනී.

5. බද්ධ ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමක පාර්ශ්වයක් අභාවප්‍රාප්ත වූ විට, එහි ඉතිරිව සිටින පාර්ශ්වකරුවන්ඒ පිළිබඳව වහාම බැංකුවට දන්වා අභාව ප්‍රාප්තවූ දිනය බැංකුව වෙත ලබා දිය යුතු ය.එබඳු ගිණුම්වල ගනුදෙනු පවත්නා නීතිය අනුව පාලනය වනු ඇත.ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමක් තම නමින් විවෘත කරන හෝ පවත්වා ගෙන යන කේවල ගිණුමක් දරන්නකුට 26 වගන්තියේ විධිවිධානයන්ට යටත්ව අදාළ ගිණුම දරන්නාගේ අභාවය සිදු වන අවස්ථාවක ගිණුමෙහි ඇති ශේෂය සඳහා ප්‍රතිලාභියකු/ ප්‍රතිලාභීන් වශයෙන් යම් තැනැත්තකු හෝ තැනැත්තන් කිහිප දෙනකු බැංකුව විසින් නිකුත් කරනු ලබන නාමයෝජනා පෝර්මයක් සම්පූර්ණ කිරීම මගින් නම් කළ හැකි ය.

6. බැංකුව ගිණුම දරන්නා හට පාස්පොතක් හෝ යම් නියමිත කාලයකට වරක් නිකුත් රනු ලබන ගිණුම් ප්‍රකාශයක් ලබා දෙනු ඇති අතර ගිණුම දරන්නා එය සුරක්ෂිතව තබා ගත යුතු ය.

## පාස්පොත් ඉතිරි කිරීම් සඳහා උපදෙස්

7. පාස්පොත තුළ ගිණුම දරන්නා හට කිසිදු සටහනක් සිදු කළ නොහැකි අතර අවශ්‍ය විට එය බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.එය පැවරීම හෝ පවරා දීම කළ නොහැකි වන අතර ඇපයක් වශයෙන් උකස් කළ නොහැකි ය.සෑම ගනුදෙනුවකින් පසුවම එහි යොදනු ලබන සටහනෙහි නිවැරදි බව තහවුරු කර ගනු පිණිස එය පරීක්ෂා කරනු ලැබිය යුතු ය.කවර හෝ දෝෂයක් වේ නම් එය වහාම බැංකුවට දන්වනු ලැබිය යුතු ය.පාස්පොත අස්ථානගත වූ හෝ විනාශ වූ අවස්ථාවක ගිණුම දරන්නා වහාම ඒපිළිබඳව බැංකුවට දැනුම් දිය යුතු ය.

8. පාස්පොතෙහි සටහනක් ඇතුළත් කිරීමකින් තොරව තැන්පතු සිදු කර තිබීමට හෝ ගිණුමට අයකර/හරකර තිබීමට ඉඩ ඇති බැවින් ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමෙහි නිවැරදි ශේෂය පාස්පොතෙහි නොදැක්වීමද විය හැකි ය.

9. නිකුත් කරන ලද පාස්පොත නිති යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.සටහන්ව ඇති අවසන් ගනුදෙනුවට පසු මාස 3 ක්

ඇතුළත පාස්පොත යාවත්කාලීන කරනු නොලද්දේ නම් සහ පසුව බැංකුව වෙතින් උපදෙස්පත්වල පිටපත් හෝ ගනුදෙනු විස්තර ඉල්ලා සිටින්නේ නම්, එම සේවය සැපයීම වෙනුවෙන් ගාස්තු අයකිරීමේ අයිතිය බැංකුව රදවා ගනී.

## ගිණුම් ප්‍රකාශ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා වූ විශේෂ උපදෙස්

10. ගිණුම් ප්‍රකාශ චක්‍රය අවසානයේ සිට දින 10 ක් ඇතුළත ගිණුම් ප්‍රකාශය නොලැබුණ හොත්, ඒ පිළිබඳව බැංකුව වෙත දැන්විය යුතු ය. ඇතුළත් කරන ලද සටහන්වල නිවැරදි බව තහවුරු කර ගනු පිණිස බැංකුව වෙතින් ලැබුණු එක් එක් ගිණුම් ප්‍රකාශය පරීක්ෂා කර බලන බවට ගිණුම දරන්නා එකඟ විය යුතු ය. ගිණුම් ප්‍රකාශය තුළ යම් දෝෂයක් වේ නම් එය ලැබුණු දින සිට දින 14 ක් ඇතුළත බැංකුව වෙත ඒ පිළිබඳව දැනුම් දිය යුතු ය.

11. ගිණුම දරන්නා ඔහුගේ/ ඇයගේ ගිණුම් ප්‍රකාශවල පිටපත් සුරැකිව තබා ගැනීම සඳහා වගකීම දරයි. ගිණුම් ප්‍රකාශයන්හි පිටපත් බැංකුව වෙතින් ඉල්ලා සිටින්නේ නම්, එම සේවය සැපයීම වෙනුවෙන් එහි ප්‍රකාශයට පත් කරන ලද අයක්‍රමයට අනුකූලව ගාස්තු අයකිරීමේ අයිතිය බැංකුව රදවා ගනී.

## තැන්පතු

12. බැංකුව සිය තනි අභිමතය අනුව බැංකුව නමින් ලියා නොමැති අණකර හා වෙනත් ගෙවීම් ඇණවුම් මිලට ගත යුතු ද නැති නම් එකතු කර ගැනීම සඳහා යවන්නේ ද යන්න තීරණය කරනු ඇත. ගෙවන බැංකුව විසින් පසුව අගරු කරනු ලැබුව හොත්, මිලට ගනුලැබූ සියලුම අයිතමයන් සම්බන්ධයෙන් (ගාස්තු ද ඇතුළුව) ආපසුලබා ගැනීමේ අයිතියමෙම බැංකුව සතු ය. අගරු කිරීමේ නිවේදනය ලැබුණු විට ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම හර කරනු ඇත.

13. මෙම බැංකුවෙහිම අණකර/ චෙක්පත් ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමේ බැරට ගෙවනු ලබන විට, බැංකුව එහි ප්‍රකාශයට පත් කරන ලද අයක්‍රමයට අනුකූලව හැසුරුම් ගාස්තු අඩු කර ගනු ඇත. එබඳු තැන්පතුවල වටිණාකම් දිනය බැංකුව විසින් එහි පවත්නා ප්‍රතිපත්තිය මත පදනම්ව තීරණය කෙරෙනු ඇත. මෙම බැංකුවෙහි නොවන අණකර/ චෙක්පත් ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමේ බැරට මිලට ගන්නා විට, ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමට බැර කිරීමේදී හැසුරුම් ගාස්තුවලට අතිරේකව එම සාධනපත්‍රයේ මුහුණත වටිණාකමෙන් වට්ටම් ගාස්තු අඩු කර ගනු ඇත.

14. ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමක් සාමාන්‍යයෙන් විවෘත කිරීම සඳහා වන අවම ආරම්භක තැන්පතුව රුපියල් 10000 ක් හෝ බැංකුව විසින් කලින් කලට නිර්ණය කරනු ලබන වෙනත් මුදල් ප්‍රමාණයක් විය යුතු ය. සුවිශේෂී තත්ත්වයන්හි දී බැංකුවට එහි තනි අභිමතය අනුව, එහෙත් කොන්දේසි අංක 22 හි අඩංගු විධිවිධානයන්ට යටත්ව, වඩාත් පහළ හෝ ඉහළ ආරම්භ තැන්පතුවකින් ගිණුම් විවෘත කිරීම පිළිබඳව සලකා බලනු ඇත.

15. රිසි වාර ගණනක් තැන්පත් කිරීම කළ හැකි ය. සෑම තැන්පතුවක්ම තැන්පතු පත්‍රිකාව වලංගු කිරීම මගින් හෝඑසේත් නැත හොත් බැංකු නිලධාරියාගේ පර්යන්ත අග්‍රයකින් හෝ බැංකුවේ බලයලත් නිලධාරියකුගේ අත්සන සහිතව පාස්පොතෙහි ඇතුළත් කරනු ලබන සටහන මගින් අනුදන්වනු ලැබේ. බලයලත් අත්සන් ලැයිස්තුවක් සහ පර්යන්ත අග්‍රයේ මුද්‍රිත ආදර්ශයක්ඔබේ ඉල්ලීම මත දැක ගත හැකි ය.

16. මුදල් තැන්පතු සඳහා පමණක් අවසර ලැබෙන අතරම, බැංකුව නමින් ලියූ ප්‍රතිලාභියාගේ නම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම් අංකය යෙදූ චෙක්පත් තැන්පතු ශාඛා කළමනාකාරවරයාගේ අනුමැතියට යටත්ව භාර ගත හැකි ය.චෙක්පත් තැන්පතු සඳහා ඉඩ සැලසෙන අතරම, ශාඛාවල චෙක්පත් තැන්පතු මංජුසා තුළ තැන්පත් කෙරිනැයි පැවසෙන කවර චෙක්පතක් සම්බන්ධයෙන්වුවද අදාළ අයවීම් (ඇතොත්) ගනුදෙනුකරුගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමට බැර කොට ඇතොත් හැර (තාවකාලික උපදෙස්පත ඉදිරිපත් කිරීම නොතකා) බැංකුව බැරකම නොදරනු ඇත. චෙක්පත් තැන්පතු මංජුසාව මගින් නිකුත් කරනු ලබනතාවකාලික උපදෙස්පත තිබියදී වුවද, ශාඛාවල චෙක්පත් තැන්පතු මංජුසා තුළ තැන්පත් කෙරිනැයි පැවසෙන කවර හෝ චෙක්පතක් සම්බන්ධයෙන් කෙරෙන කවර හෝ හිමිකම්පෑමක් වුවද එසේ තැන්පත් කරන ලද චෙක්පත් ගනුදෙනුකරුගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමට බැර කොට ඇතොත් හැරකවර හෝ තත්ත්වයන් යටතේ කවර හෝ හේතුවක් නිසාවුවද බැංකුව විසින් භාර ගනු නොලැබේ. ගනුදෙනුකාර ගිණුම්වලට බැර කරනු ලබන චෙක්පත් රැස්කිරීම සඳහා පමණක් භාර ගනු ලබන අතර, අදාළ චෙක්පත සඳහා ගෙවීම් අණ ලබන බැංකුව විසින් නිෂ්කාශනය කරනු ලබන තෙක් ආපසු ගැනීම සඳහා නොතිබෙනු ඇත. අරමුදල් තිබෙන දිනය පෙන්වා ඇත්තේ දර්ශක කාර්යයන් සඳහා පමණි. ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම්වල අරමුණ චෙක්පත් එකතු කිරීම හා නිෂ්කාශනය කිරීම නොවන අතර චෙක්පත්, ලාභාංශ පත්‍ර සහ වෙනත් දරන්නාට, තැන්පත්කරුට හෝ තුන්වන පාර්ශ්වයකට ගෙවිය යුතු ලෙස ලියන ලද සාධනපත්‍ර භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනී.

## තැන්පතුවලින් මුදල් ආපසු ගැනීම

17.අදාළ වන රීති හා රෙගුලාසිවලට යටත්ව, තැනපතුවලින් මුදල් ආපසු ගැනීම ස්වයංක්‍රීය බැංකු ගනුදෙනු යන්ත්‍ර (ටෙලර් යන්ත්‍ර / ඒ.ටී.එම්.) හෝ ශාඛාවන් වෙතින් අවශ්‍ය වන තරම් වාර ගණනක් සිදුකරනු ලැබිය හැකිය.වෙනත් බැංකුවලට අයත් ස්වයංක්‍රීය බැංකු ගනුදෙනු යන්ත්‍රවලින් මුදල් ලබා ගැනීම සඳහා වූ මුදල් ආපසු ගැනීමේ ගාස්තු හා හරපත් ගාස්තු බැංකුවේ අදාළ අවස්ථාවේදී පවතින අයගණන්වලින් ගෙවිය යුතු වේ. ශාඛාවන්හිදී ගිණුම්වලින් මුදල් ලබා ගැනීමට අවසර දෙනු ලබන්නේ - කොන්දේසි අංක22 හි විධිවිධානයන්ට යටත්ව සහ නිසැකව හඳුනා ගැනීමෙන් අනතුරුව වන අතරපාස්පොතක් නිකුත් කරනු ලැබ ඇතිජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම් සම්බන්ධයෙන් වූ විට අදාළ පාස්පොත ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.බැංකුවට සිය තනි අභිමතය මත පාස්පොත ඉදිරිපත් කිරීමකින් තොරව ශාඛා කවුන්ටරවලදී මුදල් ලබා ගැනීම (පොත රහිත මුදල් ලබා ගැනීම්) සඳහා ඉඩසැලසිය හැකි ය.බැංකුවට සිය තනි අභිමතය මත ශාඛාවන්හිදී කෙරෙන එබඳු පාස්පොත් රහිත මුදල් ලබා ගැනීම් සඳහා ගාස්තුවක් හඳුන්වා දීම හෝ පැනවීම කළ හැකි ය.අදාළ වන තැන්හිදී මුද්දර බදු හෝ වෙනත් බදු හෝ අයකිරීම් ගිණුම දරන්නා විසින් නීතියට අනුකූලව බැංකුව විසින් නියම කරනු ලබන ආකාරයට ගෙවිය යුතු වේ. ගිණුමෙන් ආපසු ගැනීම චෙක්පත් හෝ වෙනත් සාධනපත්‍ර මගින් කළ නොහැකි ය.

18. බැංකුව ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමේ හරට ගෙවීම් සිදු කිරීම සඳහා ගිණුම දරන්නා විසින් ප්‍රමාණවත් සාධාරණ කාලයක් ඇතුළත බැංකුවේ කවර හෝ ශාඛාවකට තැපෑලෙන් එවන හෝ ගෙනවිත් දෙනු ලබනසත්‍යතාව සහතික කරන ලද (ස්ථාවර උපදෙස් ද ඇතුළු) ලිඛිත උපදෙස් මත පමණක් ක්‍රියා කරනු ඇත.අදාළකාලපරිච්ඡේදය ඇතුළත එබඳු උපදෙස් මත ක්‍රියාකිරීමට අපොහොසත් වීම මගින් පැන නගින්නා වූ කවර හෝ හිමිකම් පෑම්, අලාභයන් හා පිරිවැය සඳහා බැංකුව වගකිව යුතු නොවන අතර වගකිව යුතුය යන තීරණයට යටත් නොකළ යුතු ය. ෆැක්සිමිලි, විද්‍යුත් තැපැල (ඊ-මේල්) හෝ අන් කවර හෝ විද්‍යුත් මාධ්‍ය හරහා ලැබෙන උපදෙස් සම්බන්ධයෙන් බැංකුව සහ ගනුදෙනුකරු අතර විශේෂිත ගිවිසුමක් හෝ එකඟත්වයක් නොමැතිව එබඳු උපදෙස් බැංකුව භාර නොගනු ඇත.

**පොළිය**

19. වත්මන් අනුපාතිකය අනුව දෛනිකව තිබෙන ශේෂය මත ගණනය කරනු ලබන පොළිය මාසිකව (සාමාන්‍යයෙන් මාසයේ අවසාන දිනයේදී) ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමට බැර කෙරෙනු ඇත.පොළී ගෙවීම්අංක 20 හා 22 කොන්දේසිවල අඩංගු විධිවිධානවලට යටත් ය.

20. සියලුම ගනුදෙනුකරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන පරිදි ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කිරීමේ පෝර්මයේ සිය බදු තත්ත්වය හා නේවාසික තත්ත්වය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රකාශය සම්පූර්ණ කළ යුතු ය.ගනුදෙනුකරු විසින් කරන ලද ව්‍යවස්ථාපිත ප්‍රකාශය එම විවෘත කිරීමේ (මැන්ඩේට්) පෝර්මය මගින් විවෘත කරන ලද හා පාලනය වන සියලුම පවතින හා නව ගිණුම් සම්බන්ධයෙන් අදාළ වනු ඇත.පොළී ආදායම් මත ගෙවිය යුතු වන රැඳවුම් බදු හෝ අන් කවර හෝ බදු මුදලක් වේ නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ කලින් කලට බලය පවරනු ලබන ආයතනයක් විසින් නියම කරනු ලබන (අනුපාතික/ය යටතේ) එම කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු පොළියෙන් බැංකුව විසින් අඩුකර ගනු ඇත.දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බැංකුව වෙතින් පසුව ගනුදෙනුකරු නොගෙවූ රැඳවුම් බදු මුදල් ඉල්ලනු ලබන විට එම මුදල් ගනුදෙනුකරුට දැනුම් දීමකින් තොරව ගනුදෙනුකරු වෙතින් අයකර ගැනීමේ අයිතිය බැංකුව සතු ය.

## පොදු කොන්දේසි

21. ගිණුම දරන්නාගේ ලිපිනය වෙනස් වූ විට ප්‍රමාදයකින් තොරව ඒ පිළිබඳව ලිඛිතව බැංකුවට දැනුම් දිය යුතු ය.

22. බැංකුවට සිය තනි අභිමතය මත ගිණුමේ ඉතිරි කිරීම් රුපියල් 1,000 ට වඩා පහළට බැස ඇති විට ගනුදෙනු අයකිරීම් සහ/හෝ සේවා ගාස්තුවක් අය කිරීම සහ/හෝ පොළිය රඳවා ගැනීම කළ හැකි ය.බැංකුවට සිය තනි අභිමතය මත ශාඛා කවුන්ටරය හරහා කෙරෙන ගනුදෙනු හෝ ස්වයංක්‍රීය බැංකු ගනුදෙනු යන්ත්‍ර මගින් කෙරෙන ගනුදෙනු මත වෙනම ගනුදෙනු අයකිරීම් හඳුන්වා දීමට හැකි ය.විවෘත කිරීමේ දිනයේ සිට මාස 3 ක් ඇතුළත ගනුදෙනුකරු විසින් වසා දමනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම් මත හැසුරුම් ගාස්තුවක් පනවනු ඇත.ඉල්ලීම මත ලබා ගත හැකි මෙම බැංකුවේ අයකුම පොත්පිංච තුළ දැනට අදාළ වන අයකිරීම් හා ගාස්තු අඩංගුව ඇත.

23. පනවනු ලබන සේවා ගාස්තුව වත්මන් මාසය හෝ ඊට පසුව එළඹෙන මාසය ඇතුළත ගනුදෙනුකරුගේ ගිණුමෙන් හර කරනු ලැබිය හැකි ය.

24. බැංකුව ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම්වල ගිණුම් ප්‍රකාශ සහ/හෝ ගනුදෙනු වාර්තා සටහන් අවුරුදු 7 ක කාලයක් පමණක් තබා ගනු ඇත.

25. එබඳු සියලුම වාර්තා සටහන් වර්ෂ 7කට පසුව විනාශ කෙරෙනු ඇති අතර,බැංකුව වර්ෂ 7කට පසුව ගිණුම් ප්‍රකාශ සහ/හෝ ගනුදෙනු වාර්තා සටහන් ලබා දීම සම්බන්ධයෙන් කිසිදු බැරකමක් හෝ වගකීමක් නොදරනු ඇත.

26. මේ යටතේ යවනු ලබන කවර හෝ දැනුම් දීමක් වුවද අවසාන වශයෙන් සටහන්ව ඇති ලිපිනය වෙත තැපැල් කිරීමේ සිට දින 7 ක් ඇතුළත ගිණුම දරන්නා වෙත ලැබී ඇතැයි සැලකෙනු ඇත. ලිපියක් මගින් සහ/හෝ ප්‍රාදේශීය පුවත්පත්වල පළකරනු ලබන දැන්වීමක් මගින් සහ/හෝ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම මගින් සහ/හෝ ගිණුම් ප්‍රකාශවල දැක්වෙන පණිවුඩ මගින් දෙනු ලබන ගාස්තු හා අයකිරීම්වල සහ/හෝ මෙම නියමයන් හා කොන්දේසිවල වෙනස්වීම් අදාළ ගිණුම දරන්නා වෙත එම දැන්වීම ලබාදීමක් ලෙස අර්ථ නිරූපනය කළ යුතු ය.

27. බැංකුව සිය තනි අභිමතය මත කරතොත් හැර, බැංකුව ගිණුමෙහි මුදල් තැන්පත් කිරීම් හා ලබා ගැනීම්, චෙක්පත් තැන්පත් කිරීම් හා වෙනත් හර/ බැර ගනුදෙනු පිළිබඳව ගනුදෙනුකරුට තැපැල් මගින් වෙනම උපදෙස්පත් නොඑවනු ඇත.

28. දැනුම් දීමකින් තොරව ඔබගේ ගිණුම/ ගිණුම් බැංකුව වෙත ඇති තථ්‍ය හෝ සම්භාව්‍ය, ප්‍රාථමික හෝ පාර්ශ්වික, එසේත් නැතිනම් වෙන වෙනම වූ හෝ ඒකාබද්ධ යනාදී කවර හෝ බැරකම් සමගසංයුක්ත

හෝ ඒකාබද්ධ කොට, එම ගිණුම්වල බැරට ඇති කවර හෝ මුදල් හෝ බැංකුව වෙතින් අන් කවර හෝ ගිණුමක් මත හෝ කාරණයක් මත ඔබ වෙත ලැබිය යුතුකවර හෝ මුදල් මගින් එම බැරකම්වලට හිලව් කිරීමට බැංකුවට හැකි ය.

29. ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ ගිණුම දරන්නාගේ අවසාන වශයෙන් සටහන්ව ඇති ලිපිනය වෙත දින 7 ක දැනුම් දීමක් ලබා දීමෙන් පසුව හේතු දැක්වීමකින් තොරව ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම වසා දැමීමේ අයිතිය බැංකුව රඳවා ගනී. එමෙන්ම, පාස්පොත් ඉතිරි කිරීමේ ගිණුමක් සම්බන්ධයෙන් වූ විට රුපියල් 1,000 ක හෝ ප්‍රකාශ ගිණුමක් සම්බන්ධයෙන් වූ විට රුපියල් 100 ක අවම ශේෂය පමණක් සහිත ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම් අවුරා තැබීමේ අයිතියද බැංකුව රඳවා ගන්නා අතර එම ගිණුම් වසා නොදැමුව හොත් එම මුදල් ආපසු ගැනීමට ගිණුම දරන්නා හිමිකාරිත්වය නොලැබිය යුතු ය. එබඳු අවම අවුරා තැබූ මුදල් ප්‍රමාණයන් සහිතව දිගටම පවතින හා මාස තුනක (3) ක කාලයක් අක්‍රියව පවත්නා ගිණුම් ගිණුම දරන්නාගේ අවසාන වශයෙන් සටහන්ව ඇති ලිපිනය වෙත ගිණුම වසා දමන බවට දින 7 ක ලිඛිත දැනුම් දීමක් කිරීමෙන් පසුව වසා දැමීමේ අයිතියද බැංකුව රඳවා ගනී.එබඳු අවස්ථාවන්හිදී අදාළ දින 7 ක ලිඛිත දැනුම් දීමේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර ගිණුම දරන්නා වෙතින් බැහැර කිරීමේ උපදෙස් නොලැබුණ හොත්, බැංකුවේ ගාස්තු වශයෙන් ගිණුමේ ඇති ශේෂය අවශෝෂණය කර ගැනීමේ අයිතිය බැංකුව රඳවා ගනී.

නීතිය, රජයේ රෙගුලාසි හෝ උපදෙස් මගින් මෙම නියමයන් හා කොන්දේසි සංශෝධනය කිරීම අවශ්‍ය වන්නේ නම්, ඒවා ස්වයංක්‍රීයවම සංශෝධනය වී ඇතැයි සලකනු ලැබිය යුතු ය.

30. ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කරන හෝ ඉදිරියට පවත්වා ගෙන යන කවර හෝ තැනැත්තෙක් වුවද ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් බලපවත්වන්නා වූ බැංකුවේ නියමයන් හා කොන්දේසි කියවා අවබෝධ කර ගත් බවට හා ඒවායින් බැඳෙන බවට සලකනු ලැබිය යුතු ය. කොන්දේසි අංක 25 තුළ අඩංගු විධිවිධානයන්ට යටත්ව කවර අවස්ථාවක වුවද මෙම නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ, විකරණය කිරීමේ හෝ ඒවාට එකතු කිරීම් කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනී.

31. පරිපාලන හා අභ්‍යන්තර නිරීක්ෂණ කාර්යය සඳහා ගනුදෙනුකරුට සම්බන්ධ ගිණුම් තොරතුරු ද ඇතුළු සියලුම දත්ත සම්ප්‍රේෂණය කිරීම සහ/හෝ යම් ස්ථානයක ගබඩා කර තැබීම හෝ දැරීම සිදු කිරීමට හෝ ඒවා වෙත ප්‍රවිෂ්ට වීම අවශ්‍ය වන බව බැංකුවේ, එහි ප්‍රධාන කාර්යාලයේ, ශාඛා කාර්යාලවල හෝ කවර හෝ දත්ත සැකසුම් සේවාවක සිටින බලයලත් සේවකයින්ගේ හෝ ගිණුම් ප්‍රකාශ මුද්‍රණය කිරීමට හා තැපැල් කිරීමට හෝ ඒ හා සමාන යම් සේවාවන් ලබා දීමට බැංකුව විසින් යොදවනු ලැබ ඇති කවර හෝ තැනැත්තකුගේ මතය වන විට, ඔවුන් විසින් එම දත්ත එසේ සම්ප්‍රේෂණය කිරීමට සහ/හෝ යම් ස්ථානයක ගබඩා කර තැබීමට හෝ දැරීමට හෝ ඒවා වෙත ප්‍රවිෂ්ට වීමට හැකිය යන්න පිළිබඳව ගනුදෙනුකරු එකඟ වී අනුදන්වයි.

32. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදය සඳහා අරමුදල් සම්පාදනය වැළැක්වීම සම්බන්ධයෙන් සහ සම්බාධකවලට යටත්ව ඇති කවර හෝ තැනැත්තන් හෝ ආයතන වෙත මූල්‍ය හා වෙනත් සේවාවන් ලබා දීම සම්බන්ධයෙන් බැංකුවට අදාළ වන නීතිවලට අනුකූලව බැංකුව කටයුතු කළ යුතු ය.එම නිසා එබඳු නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම පිණිස උචිත යැයි සිය තනි හා පරම අභිමතය අනුව සලකන කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට බැංකුවට හිමිකාරිත්වය ඇත.

කවර හෝ පාර්ශ්වයක් :-

(i) බැංකුව මෙම නියමයන් හා කොන්දේසි යටතේ හෝ වෙනත් වගකීම්භාරයන් යටතේ වූ සිය රාජකාරි ඉටුකිරීමෙහිදී, ඉහත කී සියලුම නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරනු පිණිස සුදුසු යැයි බැංකුව අදහස් කරන කවර හෝ පියවර මගින් සමස්ත වශයෙන් හෝ යම්තාක් දුරකට ඇති කරනු ලැබුවාවූ ප්‍රමාදයන් හා අසාමාර්ථයන් මගින්

**හෝ**

(ii) මෙම වගන්තිය යටතේ බැංකුවේ අයිතිවාසිකම්වලින් කවරක් වුවද ක්‍රියාවේ යෙදවීම මගින්

අත්විඳින (ලාභ හෝ පොළී අහිමි වීමද ඇතුළු, එහෙත් ඒවාට පමණක් සීමා නොවූ ඍජු හෝ අවස්ථානුගත)අලාභයන් හෝ හානි සඳහා

බැංකුව වගකිවයුතු නොවනු ඇත.

කවර හෝ අදාළ වන නීති රීති හා රෙගුලාසිවල ඇති අභිභවා යන (අතික්‍රමණ) අවශ්‍යතාවන්ට යටත්ව, බැංකුව ප්‍රායෝගික ලෙස සාධාරණ තරම් ඉක්මණින් එබඳු අවස්ථාවන් පැවතීම පිළිබඳව ගනුදෙනුකරුට දැන්වීමට උත්සාහ කරනු ඇත.

33. ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමක කෙරෙන වැරදි ඇතුළත් කිරීම් ඊළඟ කාලාවර්තය ශේෂ ප්‍රකාශය නිකුත් කිරීමට හෝ පාස්පොත යාවත්කාලීන කිරීමට පෙර හෝ පසු හර ඇතුළත් කිරීමක් (ප්‍රතිවර්ත ඇතුළත් කිරීමක්) හරහා ආපසු හැරවීම, නිවැරදි කිරීම හෝ අවලංගු කිරීම බැංකුව විසින් සිදු කිරීමට හැකි ය. පොළිය (හෝ වෙනත් ප්‍රතිලාභයක්) ගණනය කිරීම සම්බන්ධයෙන් බැංකුව අදාළ වැරදි ඇතුළත් කිරීම සිදු වූ දිනට ප්‍රත්‍ය ක්‍රියාකාරී ලෙස ඇතුළත් කිරීම් සිදු කරනු ලැබේ.

34. මෙහි අඩංගු නියමයන් හා කොන්දේසිවලට අතිරේකව, ගිණුමක් විවෘත කිරීමට පෙර සියලුම විභව්‍ය ගිණුම් දරන්නන් හට නිකුත් කරනු ලබන බැංකුවේ පොදු ව්‍යාපාරික කොන්දේසි තුළ අන්තර්ග්‍රහණය කර ඇති නියමයන් හා කොන්දේසිවලින් ගිණුම් දරන්නන් බැඳෙනු ඇත.මෙහි අඩංගු නියමයන් හා කොන්දේසි පොදු ව්‍යාපාරික කොන්දේසි තුළ අන්තර්ග්‍රහණය කර ඇති ඒවා වුවත්, නොවුවත්, මෙහි අඩංගු සියලුම නියමයන් මගින් ගිණුම දරන්නා නිරපේක්ෂ හා සමාන ලෙස බැඳෙනු ඇත.

## විශේෂ නියම

35. ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම් සමග ණය පහසුකම් වැනි විශේෂ නිෂ්පාදන පිරිනැමීමට ඉඩ ඇත.කෙසේ වුවද මෙම ණය පහසුකම රජයේ විශ්‍රාමිකයින් වන ගිණුම් දරන්නන් හට පමණක් අදාළ වන අතර ඔවුන් එය ලබා ගනු පිණිස සිය විශ්‍රාම වැටුප ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුම වෙත ප්‍රේෂණය කළ යුතු ය.තවද, ගිණුම දරන්නා සිය වියදමින් රක්ෂණ ආවරණයක් ලබා ගැනීම එබඳු ණය පහසුකම් ලබා ගැනීමේ පූර්ව අවශ්‍යතාවක් විය හැකි ය.

36. ගිණුම දරන්නා හට බැංකුවෙහි ස්ථිර තැන්පතු තිබේ නම් සහ ගිණුම දරන්නා හදිසි වෛද්‍ය අවශ්‍යතා සඳහා එම ස්ථිර තැන්පතු ආපසු ලබා ගන්නේ නම්, කිසිදු දඩ මුදලක් අය නොකෙරේ. කෙසේ වුවද, මෙම විශේෂ දීමනාව ලබා ගනු පිණිස ගිණුම දරන්නා බැංකුවෙහි ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වා ගෙන යා යුතු ය.

37. ගිණුම් දරන්නන් හට පිරිනමනු ලබන විශේෂ නිෂ්පාදන සහ/හෝ සේවාවන් වෙනම නියමයන් හා කොන්දේසිවලින් පාලනය වන අතර එම කොන්දේසි එම භාණ්ඩ සහ/හෝ සේවාවන් සමග වෙනම ඉදිරිපත් කෙරෙනු ඇත.

බැංකුව සමග මාගේ එකඟත්වයට අදාළ නියමයන් හා කොන්දේසි සංස්ථාපනය කරන මෙම විශේෂ කොන්දේසි සහ පොදු කොන්දේසි කියවා, තේරුම් ගෙන අවධානයට ගෙන ඇති බව මම මෙයින් සහතික කරමි.

..........................................................

ගනුදෙනුකරුගේ අත්සන

Øny: